www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: හදිසි නීතිය අහෝසි කරනු!

## Sri Lanka: End the state of emergency!

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**

**2010 මාර්තු 06**

ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මාර්තු 01 දින අලුත් කරන ලදුව, අනුමැතිය සඳහා මාර්තු 09 දින පාර්ලිමේන්තුව හමුවට ගෙන ඒමට නියමිත හදිසි නීතිය, වහාම අහෝසි කරන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) කියා සිටියි. අප්‍රේල් 08 දින පැවැත්වෙන මහ මැතිවරනයෙන් පසුව ආන්ඩුව ක්‍රියාත්මක කිරීමට යන කප්පාදු වැඩපිළිවෙලට, කම්කරුවන් හා ගම්බද දුගීන් කෙරෙන් පලවන විරෝධය මැඩීම සඳහා මෙම කුරිරු හදිසි නීති බලතල යොදාගනු ඇති බවට සසප අනතුරු අඟවයි.

2005 අගෝස්තු මාසයේදී එවකට ජනාධිපතිව සිටි චන්ද්‍රිකා කුමාරතුංග විසින් පැනවූ තැන් පටන් වත්මන් හදිසි නීති තත්වය, එක දිගට ක්‍රියාත්මකව තිබේ. 2005 නොවැම්බරයේ ජනාධිපති ලෙස පත්වූ රාජපක්ෂ, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි ඇරඹූ යුද්ධය කඩතුරාව ලෙස යොදාගනිමින් හදිසි නීතිය අඛන්ඩව පවත්වාගෙන ගියේය. පසුගිය පස් වසර පුරා පාර්ලිමේන්තුවේ දෙපාර්ශවයම එම පියවරයන්ට රබර් මුද්‍රාව තබා ඇත.

මිලිටරිය අවසාන එල්ටීටීඊ භූමිභාගයන් ද අල්ලා ගැනීමෙන් පසුව මාස නවයකට වැඩි කලක් ගතව ඇතත්, හදිසි නීතිය පවත්වාගෙන යාම යුක්තිසහගත කරනු පිනිස ආන්ඩුව තවමත් ''ත්‍රස්තවාදී'' බිල්ලා ඔසවාගෙන සිටියි. පසුගිය මාසයේදී හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටි අගමැති රත්නසිරි වික්‍රමනායක, මෙසේ කියා සිටියේය. ''ත්‍රස්තවාදයට යලිත් එහි කැත හිස එසවීමට ඉඩ දිය නොහැකියි. රාජ්‍යයේ සතුරන් යලි කාන්ඩ ගැසීමටත් එක්සත් වීමටත් උත්සාහ කරමින් සිටින නිසා හදිසි නීතිය අවශ්‍යයි.''

හදිසි නීතිය රාජක්ෂගේ ආඥාදායක තන්ත්‍රය සතු අවි ගබඩාවේ තිබෙන එක අවියකි. පෙබරවාරි 08 දින ආන්ඩුව, අසාමාන්‍ය පියවරක් තබමින් කුමන්ත්‍රනයක යෙදී සිටියේය යන අපැහැදිලි හා තහවුරු නොකල චෝදනා මත, විපක්ෂයේ ජනාධිපති අපේක්ෂක, විශ්‍රාමික ජෙනරාල් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගත්තේය. ජනවාරි 26 ජනාධිපතිවරනයෙන් පරාජයට පත් ෆොන්සේකා, මිලිටරි පොලිසිය විසින් නාවික හමුදා මූලස්ථානය තුල තවමත් රඳවාගෙන සිටින අතර ඔහුට විරුද්ධව තවමත් කිසිදු චෝදනාවක් ඉදිරිපත් කෙරී නැත. පොලිසිය ෆොන්සේකාගේ මෙන්ම විපක්ෂ එක්සත් ජාතික පක්ෂයේ (එජාප) හා ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ආධාරකරුවන් ද රඳවාගෙන සිටියි.

මහ මැතිවරනයට පෙරාතුව විපක්ෂයට එරෙහි ආන්ඩුවේ කඩා පැනීමෙහි අර්ථය වන්නේ, කම්කරු පන්තිය සමඟ ගැටුමක් සඳහා සූදානම් වීම පිනිස සිය බල ග්‍රහනය තහවුරු කර ගැනීමයි. රට දැවැන්ත ලෙස නයවී සිටින අතර, අයවැය හිගය අඩකටත් වැඩි ප්‍රමානයකින් කපාහැරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) යොදන බලපෑමටළු එය හසුව සිටියි. මැතිවරනය නිමාවීමත් සමඟ රාජපක්ෂ, වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන්ට එරෙහිව ප්‍රහාරයක් මුදා හරිමින්, ඕනෑම විරෝධයක් මැඩීම සඳහා සිවිල් යුද්ධය පැවති 26 වසර පුරා ගොඩනගන ලද පොලිස්=රාජ්‍ය මෙවලම යොදාගනු ඇත.

හදිසි නීතිය අලුත් කිරීමේ අරමුනු දෙකක් තිබේ. පලමු වැන්න, ''ත්‍රස්තවාදය'' පිලිබඳ භීතිය වපුරවමින් හා සිංහල, දෙමල කම්කරුවන් බෙදීමේ අරමුනෙන් වර්ගවාදී ආතතිය ඉහල නැංවීම සඳහා ආන්ඩුව අඛන්ඩව ගෙනයන ව්‍යාපාරයේ කොටසක් ලෙස එය යොදාගැනීමයි. දෙවැන්න, පරිශ්‍රයන් සෝදිසි කිරීමට, චෝදනා රහිතව පුද්ගලයින් රඳවා තැබීමට, රැස්වීම් හා පෙලපාලි තහනම් කිරීමට, මාධ්‍ය වාරනයට, කාර්මික අරගල නීති විරෝධී කිරීමට, කම්කරුවන් දොට්ට දැමීමට සහ අත්‍යවශය සේවාවන් පවත්වාගෙන යාම පිනිස ආරක්ෂක හමුදා යොදාගැනීමට හදිසි නීතිය මගින් රාජපක්ෂට අසීමිත බලතල ලැබේ.

රටේ දෙමල සුලුතරය ක්‍රමානුකූල හිරිහැරයන්ට හා වධබන්ධනයන්ට ලක් කිරීමේ මූලික මෙවලමක් ලෙස, ආන්ඩුව, පසුගිය සිව් වසර පුරාවටම හදිසි නීති බලතල යොදගෙන තිබේ. දස දහස් ගනන් මිනිසුන් හදිසි නීතිය හෝ ඊට අනුබද්ධ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීටීඒ) යටතේ ''එල්ටීටීඊ සැකකරුවන්'' ලෙස අත්අඩංගුවට ගෙන ඔවුන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කරමින් නඩු නොමැතිව රඳවා ගෙන සිටී.

හදිසි නීතිය යටතේ රඳවා තැබීම, පීටීඒ යටතේ රඳවා තැබීමටත් වඩා ව්‍යාකූලය. ''ජාතික ආරක්ෂාවට'' හානිකර යයි සැලකෙන ක්‍රියාවන්ට සම්බන්ධ ඕනෑම

අයෙකු, ආරක්ෂක ලේකම්ගේ, වර්තමානයේ නම් ජනාධිපතිගේ සොහොයුරා වන ගෝඨාභය රාජපක්ෂගේ, නියෝගයක් මත රඳවා තැබිය හැක. 2008 අගෝස්තුවේදී, නඩු නොමැතිව රඳවා තැබීමේ කාලසීමාව මාස 12 සිට 18 දක්වා දීර්ඝ කිරීම සඳහා මෙම නීතිය සංශෝධනය කරන ලදි. රැඳවියන් දින 30කට පසුව අධිකරනය හමුවට ගෙන ආයුතු වුවත්, අධිකරනයට ඔවුන් නිදහස් කිරීමේ බලයක් නැත.

හදිසි නීතිය දැනටමත් කම්කරු පන්තියට විරුද්ධව යොදාගෙන තිබේ. යුද්ධය යලි ආරම්භ කර යන්තම් දෙසතියක් ගතවූ 2006 අගෝස්තුවේ, රාජපක්ෂ මහ බැංකුව, ඛනිජතෙල් සැපයුම, තැපැල් හා විදුලි සංදේශ, නිර්යාත කර්මාන්ත හා මගී ප්‍රවාහනය ''අත්‍යවශ්‍ය සේවා'' ලෙස ප්‍රකාශයට පත් කලේ, වෘත්තීය ක්‍රියාමාර්ග තහනම් කිරීමට ඉඩ සලසා ගනිමිනි. ඔහු මේ පුලුල් පියවර යුක්ති සහගත කලේ, වැටුප් වැඩිවීමක් ඉල්ලා වරාය කම්කරුවන් ගෙන ගිය අකුරට වැඩ කිරීමේ ව්‍යාපාරයට ප්‍රතිචාරයක් වසයෙනි.

යුද්ධය පැවති අවධියේ රාජපක්ෂ, ජාතික ආරක්ෂාවට වලකපන හා ''ත්‍රස්තවාදීන්ට'' අනුබල දෙන බවට වැඩ වර්ජක කම්කරුවන් වෙත නිරතුරුව චෝදනා එල්ල කලේය. වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටි සෞඛ්‍ය සේවකයන්ගේ වැඩ වර්ජනය බිඳීම සඳහා 2008 වසරේදී ඔහු, රෝහල්වලට හමුදාව යෙදවීය. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව ජනාධිපති, තමන් ''ජාතිය ගොඩනැගීමේ ආර්ථික යුද්ධයක්'' ගෙනයන බව ප්‍රකාශ කලේය. සිය ආර්ථික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන කල රාජපක්ෂ, තම මූලික අවශ්‍යතා රැක ගනීමට පෙල ගැසෙන වැඩකරන ජනතාව ''ද්‍රෝහීන්'' ලෙස හංවඩු ගසනු නො අනුමානය.

පසුගිය නොවැම්බරයේදී රාජපක්ෂ පලමු වතාවට, වැටුප් වැඩිවීමක් ඉල්ලා ඛනිජ තෙල් සංස්ථා, විදුලිබල මන්ඩල, ජල සම්පාදන මන්ඩලය හා වරාය කම්කරුවන් ගෙනගිය වෘත්තීය ක්‍රියාමාර්ගය තහනම් කිරීමට හදිසි නීතිය යටතේ අත්‍යවශ්‍ය සේවා නියෝග පැනවීය. එම තීරනයට එරෙහිව උද්ඝෝෂනයක් ගෙනයාම කෙසේ වෙතත්, ඊට සම්බන්ධ වෘත්තීය සමිති කලේ, වහාම හකුලා ගැනීමයි.

රටේ හදිසි නීති බලතල පිලිබඳ සමස්ත ඉතිහාසයම පෙන්නුම් කරන්නේ, එහි කම්කරු විරෝධී අරමුනයි. 1947 දී, නිදහසෙන් මඳ කලකට පෙර, මහා වැඩවර්ජනයට සම්බන්ධවූ කම්කරුවන්ට වෙඩි තැබීමට ආන්ඩුකාරවරයා නියෝග දීමෙන් දින කිහිපයක් ගතවීමටත් පෙරාතුව බ්‍රිතාන්‍ය විජිත පාලනාධිකාරය මහජන ආරක්ෂක ආඥාපනත හඳුන්වා දුන්නේය. ඉන් පසුව බලයට පත් කොලඹ ආන්ඩු, සෑම දේශපාලන අර්බුදයක් මධ්‍යයේම හදිසි නීති බලතල යොදාගැනීමට උත්සුක වූහ. 1953 වසරේදී මුලු දිවයිනම සොලවාලූ මහා වැඩවර්ජනය හා හර්තාලය තුල එය කැපී පෙනුනි. වසර කිහිපයක හැරෙන්නට, 1979 පටන් මේ දක්වා හදිසි නීතිය බලාත්මකව ඇත.

හදිසි නීතියට විරෝධය දැක්වීමේදී කම්කරුවන්, විරුද්ධ පක්ෂ කෙරෙහි කිසිදු විශ්වාසයක් නොතැබිය යුතුය. ආන්ඩුව මෙන්ම එජාප හා ජවිපෙ ද ආන්ඩුව මෙන්ම එම සිංහල අධිපතිවාදය තුලම ගිලී සිටින අතර, රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට පිටුබලය දෙමින් වතාවතක් ලෙස සෑම මාසයකදීම හදිසි නීතිය අලුත් කරනු පිනිස ඡන්දය දුන්හ. රාජපක්ෂගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් පිලිබඳව මහජන උත්සුකතාව දැල්වෙද්දී එජාප හා ජවිපෙ, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ගේ ආරක්ෂකයන් ලෙස ව්‍යාජ රඟපෑමක් පටන් ගත්හ. කෙසේ වෙතත් පාර්ලිමේන්තුව තුල ඔවුන්ගේ ''විරුද්ධත්වය,'' තමන්ට එරෙහිව හදිසි නීති බලතල යොදා නොගන්නා ලෙසට රාජපක්ෂට කරන ආයාචනාවලට සීමා වී තිබේ. පසුගිය තෙමසක කලය තුල ජවිපෙ, හදිසි නීතිය පිලිබඳ පාර්ලිමේන්තු ඡන්දය මගහැරියා මිස, එයට විරුද්ධව ඡන්දය පාවිච්චි කලේ නැත. පසුගිය මාසයේ එජාප මන්ත්‍රීහු, සංකේතාත්මකව විරුද්ධව ඡන්දය දීමට එක් මන්ත්‍රීවරයෙක් ඉතිරි කර ඡන්දය මගහැරියහ.

කම්කරුවන් තමන්ගේම ස්වාධීන ශක්තිය මත විශ්වාසය තැබිය යුතුය. වැඩකරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වැඩබිම්වල ද වතුකරයේ ද කම්කරු නිවහන් ප්‍රදේශවල ද නගර හා ගම්වල ද ක්‍රියාකාරී කමිටු ගොඩනගන ලෙස සසප ඉල්ලා සිටියි. පීටීඒ හා අනෙකුත් මර්දනකාරී අන පනත් අහෝසි කිරීම මෙන්ම ජනවර්ගය, ආගම හා භාෂාව මත පදනම් වූ සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් අවසන් කිරීම සඳහා ද කෙරෙන පුලුල් උද්ඝෝෂනයක කොටසක් ලෙස අපි, හදිසි නීතිය අහෝසි කල යුතු බව කියා සිටිමු. නඩු නොමැතිව සිරගත කොට සිටින සියලු දෙනා වහා නිදහස් කිරීමත් තවමත් ලක්ෂයකට අධික දෙමල සිවිල් වැසියන් සංඛ්‍යාවක් රඳවා ඇති ''ශුභ සාධන ගම්මාන'' වසා දැමීමත් උතුරේ හා නැගෙනහිරේ හමුදා වාඩිලෑම අවසන් කිරීමත් අවශ්‍ය බව සසප කියා සිටියි.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ අරගලය, ධනවතුන් අතලොස්සකගේ ලාභය නොව, බහුතර වැඩකරන ජනතාවගේ අවශ්‍යතා සපුරාලන පරිදි සමාජය ප්‍රතිව්‍යුහගත කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක් සඳහා පුලුල් අරගලය සමඟ අවියෝජනීය ලෙස බැඳී තිබේ. දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් වෙනුවෙන් සසප සටන් වදියි. අපගේ මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වන මෙන් අපි, කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටිමු.


© www.wsws.org